# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2184/49 - 2020 ජූලි මස 17 වැනි සිකුරාදා - 2020.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත**

සපරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය - 2020

175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 2151/21 හා 2019.11.26 වන දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව වන්දනාගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනතාවගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධව පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

1. ***පෙරහැර පවත්වන කාල සීමාව*** -

- මෙවර සපරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2020 වර්ෂයේ අගෝස්තු 18 වැනි දිනෙන් ආරම්භ වී සැප්තැම්බර් 03 වැනි දින දිය කැපීමේ මංගල්‍යය සහ දහවල් පෙරහැරින් පසු අවසන්වන බව දැනුම් දෙමි.

2. ***කඳවුරු ප්‍රදේශය යනු*** -

- උතුරට වැසියන් පදිංචි පරවේනි නිලකරුවන්ගේ ඉඩම් රථගාල් හා සල්පිල් භූමිය පෙන්වන සිමෙන්ති කාණුව හා රථ ගාලට ඇතුලුවන පාර ද, දකුණට තෙන්නගේවත්ත හා කලු ගඟ ද, නැගෙනහිරට රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට දේවාලය සතු මහ උයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ.

3. ***වාහන*** -

3.1. මාගේ හෝ බලයලත් නිලධාරියකුගෙන් හෝ ලබාගත් අවසරයකින් තොරව, කිසිවකු විසින් මෝටර් වාහනයක්, බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන වෙන් කර ඇති රථගාල් පරිශ්‍රයෙන් හැර වෙනත් කිසිදු ස්ථානයක හෝ උත්සව භූමිය තුළ නතර කර තැබීම හෝ ඇතුල් කිරීම තහනම් කරමි.

3.2 රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදි කර ඇති ප්‍රධාන වාහල්කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

1A - G 32514 – 22 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ***ගොඩනැගිලි ඉදි කිරීම*** -

4.1 මාගෙන් හෝ බලයලත් නිලධාරියකුගේ හෝ ලිඛිත අවසරයක් නොමැතිව, 2020 වර්ෂයේ අගෝස්තු 18 වැනි දින සිට සැප්තැම්බර් මස 03 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය තුළ යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකළ යුතුය.

4.2 එසේ වුව ද, මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියෝග අතුරෙන් යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළු වීම, සහ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක, යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක්, ගොඩනැගීමක් සිදු කිරීමට අවසර ලැබෙනු ඇත.

5. ***සෞඛ්‍යය*** -

5.1 යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ පවතින වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වගබලාගත යුතුය.

6. ***වෙළෙඳාම*** -

6.1 මාගේ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

6.2 කඳවුරු භූමිය තුළ දැනට පවත්නා මල්, පූජා භාණ්ඩ අලෙවි කරන වෙළෙඳ සැල් 2020.08.28 දින සිට 2020.09.03 දින දක්වා වසා තැබීමට කටයුතු කළ යුතුය.

7. ***යාචකයෝ*** -

- හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමියෙන් පිටත වෙන් කර ඇති හෝ සපයනු ලැබ ඇති ස්ථානයන්හි දී මිස, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

**මාලනී ලොකුපෝතාගම,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
සමන් දේවාල කඳවුර භාර නිලධාරී.

2020 ජූලි මස 06 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07 - 869

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.